## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## සිංහල අංශය
## පාසල් නිවාඩු කාලයට ශිෂ්‍ය උපකාරක අත්වැල

# සිංහල සාහිත්‍යය
# 11 ශ්‍රේණිය - 2020 දෙවැනි වාරය

## කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

**ආදරණීය දූවේ පුතේ,**

මෙම පාඩම අධ්‍යයනය කිරීමේ දී ඔබ, පහත සඳහන් කරුණු පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන්න.

පියවර 1 :

- **පෙළ පොතේ පාඩම ආරම්භයේ (කහපාට කොටුවේ) ඇති හැඳින්වීම පාඩම් කරගන්න.**
- **පාඩමේ නිර්දිෂ්ට කවි 10 ම පාඩම් කර ගන්න.**
- **ඒ ඇසුරින් පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න සකස් කෙරේ.**

1. **(i)** **(අ)** කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?
   **(ආ)** එම කෘතියේ කතුවරයා නම් කරන්න.
   **(ii)** **(අ)** මෙම කෘතිය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයක දී ද?
   **(ආ)** එම යුගයේ රජ කළ රජු නම් කරන්න.
   **(iii)** (අ) බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, එළු අත්තනගලු වංශය ආදී කෘතිවල කතුවරයා නම් කරන්න.
   **(ආ)** මෙම පැදි පෙළේ සඳහන් පිරිවෙන් විහාරස්ථානය කුමක් ද?
   **(iv)** **(අ)** පාලි රසවාහිනියෙහි වත්ථුල පබ්බත නමින් හැඳින්වූ ස්ථානය නම් කරන්න.

   (ආ)

   දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
   සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි
   ..........................................................................................
   ..........................................................................................

   ඉහත පද්‍යයේ ඉතිරි දෙපදය ලියන්න.

පියවර 2:

- **දුරවබෝධ පදවල අරුත් මතක තබා ගන්න.**
- **එක් එක් කවියේ සමස්ත අදහස වචනයෙන් ලිවීමට හැකි දැයි විමසා බලන්න.**
- **ඒ ඇසුරින් පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න සකස් කෙරේ.**

2. (i)

**පවන'ද පිපි** තුරේ ය නිර තුරේ ය
කුසුමන් පෙති තුරේ ය මළු තුරේ ය
අවට සුපිපි **සරේ ය** බිඟු සරේ ය
සිත එවෙහෙර කෙරේ ය ලොබ කෙරේ ය

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) විහාරය කෙරේ ආශාව ඇති කරන කරුණු දෙකක් දක්වන්න.

(ii)

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

(අ) මෙම ගම් පියසේ ජනතාව කෘෂිකාර්මික ජීවිතයක් ගත කරන බව කියැවෙන කරුණු දෙකක් ලියන්න.

(ආ) සමස්ත පද්‍යයේ අර්ථය ලියන්න.

**පියවර 3:**

- **රචනාමය ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ඉහත පියවර දෙක සහ ඔබගේ රචනාමය හැකියාව පිළිබඳ අවබෝධය මැන බැලෙයි.**

3. (i) කැරගල ප්‍රදේශයේ ජනතාවගේ යහගුණ ගෙන හැර පෑමත්
   (ii) ගම් පියසේ සුන්දරත්වය කියා පෑමත්
   කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට පැදි පෙළ රසවත් නිර්මාණයක් වීමට ඉවහල් වී ඇත. එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.
4. (i) බස හැසිරවීමේ දී කවියා පෑ කුසලතාවත්
   (ii) කවියා යොදා ගත් කාව්‍යෝපක්‍රමත්
   කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට පැදි පෙළ විශිෂ්ට නිර්මාණයක් වීමට ඉවහල් වී ඇත.
   එක් කරුණකට සුදුසු නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.
5. අර්ථ රසය මෙන් ම ශබ්ද රසය මැනවින් යොදා ගැනීමට වීදාගම හිමියන් තුළ වූ කුසලතාව කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට පැදි පෙළෙන් ධ්වනිත වේ. සුදුසු නිදසුන් **තුනක්** දක්වමින් විමසන්න.

සැකසුම : ඩබ්ලිව්.ටී. ඩබ්ලිව්. කරුණාරත්න,
ගුරු උපදේශක, (සිංහල)
කලාප අධ්‍යාපන කාර්යාලය,
ඇල්පිටිය.

**දැන් ඔබ සාර්ථක ව අධ්‍යයනය කළා දැයි බලන්න.**

**1.** **(i)** **(අ) හංස සන්දේශය**

**(ආ)වීදාගම මෛත්‍රේය හිමි**

**(ii)** **(අ) කෝට්ටේ සාහිත්‍ය යුගය**

**(ආ)vi වන පරාක්‍රමබාහු රජු**

**(iii)** **(අ) වීදාගම මෛත්‍රේය හිමි**

**(ආ)කැරගල පද්මාවතී පිරිවෙන් විහාරය**

**(iv)** **(අ) කැරගල**

**(ආ)පැහැපත සුද නො හළ වැලි අතුළ මළු** තැනි

**මිහිකත සඳන'ලෙවි දුන් උර මඩල** වැනි

**2.** **(i)** **(අ) පවන' ද - සුළඟ අවුත්**

**සරේ ය - විල්වල**

**(ආ)සුළග අවුත් නිරන්තරයෙන් මල් පිපුණු ගස්වල මල්පෙති මලුවෙහි අතුරවීම. හාත්පසින් මල් පිපුණු විල්වල මී මැසි නාදය ඇසෙයි.**

**(ii)** **(අ) හාත්පසින් ම නිරතුරු ව කෙත්වතුවල සුවඳැල් නම් වී වර්ගය පැසෙයි. කුඩා වසු පැටවුන්ගේ හඬ ඇතට ඇසෙයි.**

**(ආ)හාත්පසින් ම නිරතුරු ව කෙත්වතුවල සුවඳැල් නම් වී වර්ගය පැසෙයි. කුඩා වසු පැටවුන්ගේ හඬ ඇතට ඇසෙයි. එහි විහාරය දිව්‍ය විමානයක් ලෙසට පෙනෙයි. එම ප්‍රදේශය දුටු විට අමෘත රසයක් හිතට දැනෙයි.**

**3.** **මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිලිමත් වන්න.**

**පිළිතුරේ ආරම්භක ඡේදය - (හැඳින්වීම)**

**මෙවැනි ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී ආරම්භක ඡේදය, යුගය, කතුවරයා හා අදාළ කෘතිය ගැන සඳහන් කරමින් ප්‍රශ්නයෙන් උපුටා ගත් කොටසක් ද එක් කරමින් පටන් ගන්න.**

**උදා:** කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී වීදාගම මෛත්‍රේය මාහිමියන් විසින් විරචිත හංස සන්දේශයෙන් උපුටා ගත් කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට රසවත් සාහිත්‍ය නිර්මාණයක් වීමට කැරගල ප්‍රදේශයේ ජනතාවගේ යහගුණ ගෙනහැර පෑමත්, කැරගල ගම් පියසේ සුන්දරත්වය ගෙනහැර පෑමත් ඉවහල් වී ඇති බව අපට පසක් වේ.

**(ඉන් පසු නිදසුන් දෙකක් ඇසුරින් පළමු කරුණ තහවුරු කිරීම අවශ්‍ය ය.)**

(i) කැරගල ප්‍රදේශයේ ජනතාව යහගුණ සපිරි, ආගමික නැමියාවකින් යුත් අය බව එහි පද්‍ය තුළින් අපට මනාව පිළිබිඹු වේ.

නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණු ය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණු ය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණු ය
සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණු ය

නිවසක් පාසා ශ්‍රද්ධාවෙන් දන් දීමෙහි යෙදෙන සිය ගණන් ජනතාව නිතර පැමිණ වන්දනා මාන කරන බව කවියා අපට මනහර ලෙස කියා පායි.තවත් විටෙක එම ගම් පියසේ ඇති විහාරස්ථානය සසර බිය දුරු කරන වටිනා ආගමික සිද්ධස්ථානයක් බව පැවසීමෙන් ද එම ප්‍රදේශයේ ජනතාව තුළ ඇති භක්තිය කියා පායි.

නිබඳ පැසී පල ලඹ දෙන මිහිරඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹය
නොමඳ තැනින් තැන වලු බර වනරඹය
එමැද වෙහෙර දිළි දුර ලන සසරබය

එවන් පසුබිමෙක වෙසෙන ජනයා අනිවාර්යයෙන් ම යහගුණ සපිරි ජනතාවක් බවත් අපට හැඟේ.

(ii) එමෙන් ම කැරගල ගම් පියසේ සුන්දරත්වය වර්ණනා කිරීමත් මෙම පැදි පෙළ රසවත් වීමට බෙහෙවින් ඉවහල් වී ඇති බව අපට පැහැදිලි ය.

සාර පලය අඹ දඹ රඹ ද වල්පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නැර ලොලය වඩවන දුටු දනන් හට
කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

කැරගල ප්‍රදේශයේ පවත්නා සශ්‍රීකත්වය මෙන් ම සුන්දරත්වය ද මෙම පද්‍යය තුළින් මනා ව පැහැදිලි කෙරේ. අඹ, දඹ, රඹ ආදී පලතුරුවලින් හෙබි මෙම ප්‍රදේශයේ කඳු මුදුන්වලින් ගලා බස්නා මිහිරි වූ ජලය ද ඒ බව සනාථ කරයි.

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රස ම ය ඒ පියස දුට

අවට නිරතුරු ව සුවඳැල් කෙත් වත් පැසී ඇති වසු පැටවුන්ගේ හඬ ඇතට ඇසෙන සුන්දර ගම් පියසක ස්වභාවය කවියා මෙහිදී වර්ණනා කරයි.

**(අවසන් ඡේදය)**

මේ අනුව අපට පෙනී යන්නේ කැරගල වෙහෙර වැනුම පද්‍ය පන්තිය රසවත් නිර්මාණයක් වීමට බලපෑ හේතූන් අතර කැරගල ප්‍රදේශයේ ජනතාවගේ යහගුණ ගෙන හැර පෑමත්, කැරගල ප්‍රදේශයේ සුන්දරත්වය වර්ණනා කිරීමත් බලපා ඇති බව අපට පැහැදිලි වේ.

6. කෝට්ටේ සාහිත්‍ය යුගයේ වීදාගම මෛත්‍රේය හිමියන් විසින් රචිත හංස සන්දේශයේ උපුටා ගත් කැරගල වෙහෙර වැනුමෙන් අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද මැනවින් සංකලනය කර කාව්‍ය නිර්මාණයට කවියා තුළ වූ කුසලතාව විශද කෙරේ.

කුළින් කුළ ම සිහිලඹ වැහෙන කඳුරුය
දොළින් දොළ ම කල් යල් කරන කුඹුරුය
පළින් පළ ම තල් පොල් ගෙවතු මැඳුරුය
තළින් තළ ම පුල් පියුමුපුල පඬුරුය

ස්වභාවෝක්ති වර්ණනය වඩාත් ප්‍රිය කළ කවියකු ලෙස හංස කවියා මෙහිදී අපට පසක් වේ. එමෙන් ම මාත්‍රා 17 බැගින් වූ සම මත් විරිතක් කවියා උපයෝගී කොට ගෙන ඇති බැව් පැහැදිලි ය. පද්‍ය යේ මුල සහ අග යන අවස්ථා දෙකක දී එළිසමය රැක ඇති බවත් අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද මැනවින් සංකලනය කොට ඇති බැව් පෙනේ.

මිහඹ මුව මඩල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

හංස කවියා උපමා බහුල ව යොදා ගනිමින් තම අදහස සහෘදයා වෙත ගෙන යාමට දැරූ සාර්ථක උත්සාහයක් මින් ගම්‍යමාන වේ. මිහඹ මුව මඩල මෙන්, මී රස ලැබ බොන ලෙස ආදී උපමා ඊට කදිම නිදසුන් වේ.

නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණුය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණුය

කැරගල ගම් පියසේ ජනතාව තුළ වූ භක්තිවන්තභාවය හා ගම් පියසේ චමත්කාර දර්ශනය පිළිබඳ චිත්තරූප මැවීමෙහිත් මෙම පද්‍යය සමත් වේ. ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණු යන්නෙන් ජනතාවගේ භක්තිවන්ත බව පසක් වේ.

මේ අනුව අපට පෙනී යන්නේ අර්ථ රසය මෙන් ම ශබ්ද රසය මැනවින් යොදා ගනිමින් පද්‍යාකරණයට කවියා තුළ වූ කුසලතාවයි.